# ජාතික ක්‍රීඩා අරමුදල

## මෙහෙවර ප්‍රකාශය

**ශ්‍රී ලංකාවේ ක්‍රීඩා වලට ධෛර්ය දීම , ඒවා දියුණු කිරිම හා සංවර්ධනය කිරිම සඳහා ආධාර සහ අනුබල දීම ජාතික ක්‍රීඩා අරමුදලේ මෙහෙවරයි.**

## දැක්ම

**ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ හැකියාවන් වර්ධනය කිරිම.**

## නිතිමය පසුබිම

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරණ ක්‍රීඩා පනතින් ජාතික ක්‍රීඩා අරමුදල ස්ථාපිත කරුණු ලැබීය. පනතට අනුව අරමුදලේ කාර්යයන් සඳහා රජයෙන් ලැබිය හැකි මුදල් විදේශ රටකින් ලැබෙන ආධාර මුදල්, යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා උත්සවයක් වෙනුවෙන් අනුග්‍රහය දැක්වීම පිණිස යම් ආයතනයකින් ලැබෙන මුදල්, යම් තැනැත්තෙකු විසින් පරිත්‍යාග වශයෙන් ලැබෙන මුදල්, වෙනයම් මාර්ගයකින් ලැබෙන මුදල් අරමුදලට බැරිවිය යුතුය. අමාත්‍යවරයා විසින් නිශ්චය කරණු ලැබිය හැකි මුදල් ප්‍රමාණයන් ශ්‍රී ලංකාවේ යම් ක්‍රීඩාවකට ධෛර්ය දීම, දියුණු කිරිම හා සංවර්ධනය සඳහාද ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට කරුණා සහගත ගෙවීම් වශයෙන්ද, ආයෝජනය කිරිම සඳහාද මේ පනතේ විධිවිධාන ක්‍රීයාත්මක කිරිමේ හෝ බලගැන්විමේ කාර්ය සඳහාද අරමුදලෙන් මුදල් ගෙවිය හැකිය.

# 2016 වර්ෂය සදහා වාර්ෂික පාලන වාර්තාව

2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සදහා ජාතික ක්‍රීඩා අරමුදලේ වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

## හැඳින්වීම

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරණ ක්‍රීඩා පනතේ අංක 22 සිට 27 දක්වා ඇති විධිවිධාන අනුව ස්ථාපිත කරනු ලැබූ ජාතික ක්‍රීඩා අරමුදල 2007 වර්ෂයේ සිට ක්‍රීඩා අමාත්‍යාංශයේ පූර්ණ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය. වාර්ෂිකව ක්‍රීඩක ක්‍රීඩිකාන්ගේ පෝෂණ තත්වය ඉහළ නැංවීම හා ක්‍රීඩා හැකියාවන් නංවාලීම අරමුණු කර ගෙන අරමුදලේ කාර්යයන් කරගෙන යන ලදී.

## ජාතික ක්‍රීඩා අරමුදලේ කාර්ය භාරය

ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ජාතික ක්‍රීඩා අරමුදල මඟින් ශ්‍රී ලාංකේය ක්‍රීඩාවේ සංවර්ධනය උදෙසා ක්‍රීඩාවට සම්බන්ධිත මානව සම්පත් වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් ,පුහුණුකරුවන් මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයේ භෞතික හා වෙනත් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පවතින ප්‍රතිපාදන යටතේ අරමුදල් ලබා දීම සිදු කරනු ලබයි.

වර්තමානයේ ක්‍රීඩා අරමුදල මඟින් මතු සඳහන් කාර්යයන් සම්බන්ධයෙන් අවස්ථානෝචිත පරිදි ගෙවීම් සිදු කරනු ලැබේ.

එනම් ජාත්‍යන්තර තරඟ ජයග්‍රහණ වෙනුවෙන් ක්‍රීඩකයන් හා පුහුණුකරුවන් වෙත අනුමත කර ඇති නිර්ණායකයන් යටතේ ගෙවීම් කිරීම, හඳුනාගත් නිර්ණායකයන් යටතේ මාසිකව ක්‍රීඩකයන් සඳහා සිදු කරන පෝෂණ දීමනා ගෙවීම්, ක්‍රීඩාවේ අභිවෘද්ධිය වෙනුවෙන් නිර්දේශිතව විශේෂිත ඉල්ලීම සඳහා දෙනු ලබන දීමනා, ජාතික මහා ක්‍රීඩා උළෙල සඳහා අනුග්‍රහය දැක්වීම, දේශීය හා විදේශිය පුහුණු වැඩසටහන් සඳහා කරනු ලබන ගෙවීම්, විශේෂිත වූ ක්‍රීඩා උත්සව සඳහා සිදු කරන තිළිණ ප්‍රදානයන්,විශේෂිත ප්‍රදානයන්(එනම් විශ්වවිද්‍යාල හා වෙනත් ආයතන සඳහා සිදු කරනු ලබන ක්‍රීඩා උත්සව වෙනුවෙන් ගෙවීම්, ක්‍රීඩකයන් විශ්‍රාම යාමේදී/ක්‍රීඩාවෙන් සමුගැනීමේ දී සිදු කරන ගෙවීම්, විශේෂිත ක්‍රීඩා උපකරණ ඉල්ලීම් සඳහා අනුග්‍රහය දැක්වීම්, දේශිය විදේශීය තරඟ වෙනුවෙන් විවිධ කණ්ඩායම් සඳහා කරන දීමනා ගෙවීම්, සානුකම්පිත හේතුන් මත ක්‍රීඩාවට සම්බන්ධ වූ පුද්ගලයන්ට සිදු කරන ගෙවීම හා ක්‍රීඩාවේ සංවර්ධනය අපේක්ෂිතව සිදු කරනු ලබන වෙනත් ගෙවීම් වේ).

## ක්‍රීඩා සම්මේලන සඳහා ලබා දුන් මුදල්

විවිධ ක්‍රීඩා ඉසව් නියෝජනය කරනු ලබන ක්‍රීඩා සම්මේලන වලට ප්‍රතිපාදන මුදාහැරීමට ක්‍රියා කිරිම මගින් 2016 වර්ෂය තුල ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා තරග රැසකට ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහභාගි කරවන ලදී. ක්‍රීඩා සම්මේලන වල ඉල්ලිම් සලකා අරමුදලෙන් ලබා දෙන ලද මුදල් ප්‍රමාණයන් පහත දක්වා ඇත.

| අනු අංකය | ක්‍රීඩා සම්මේලන | ගෙවු මුදල (රු.) |
|---|---|---|
| 1. | ශ්‍රී ලංකා රග්බි පාපන්දු සංගමය | 750,000.00 |
| 2. | සමස්ථ ලංකා කරාතේ දෝ සංගමය | 150,000.00 |
| | **එකතුව** | **900,000.00** |

## ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මුදල් ආධාර ලබා දීම

| අනුක්‍රමික අංකය | කාරණය | ගෙවු මුදල (රු.) |
|---|---|---|
| 1 | ක්‍රීඩකයන් සඳහා පෝෂණ දීමනාව | 6,215,000.00 |
| 2 | ක්‍රීඩා භාණ්ඩ හා අනෙකුත් සැපයුම් | 370,700.00 |
| | **එකතුව** | **6,585,700.00** |

## ක්‍රීඩා තරග වෙනුවෙන් මුදල් අධාර ලබා දීම

2016 වර්ෂයේදි ශ්‍රි ලංකාව තුල පවත්වන ලද ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා තරග සඳහා වු ජාතික ක්‍රීඩා අරමුදලේ දායකත්වය පහත දක්වා ඇත.

| අනුක්‍රමික අංකය | කාරණය | ගෙවු මුදල (රු.) |
|---|---|---|
| 1. | ජාතික මහ ක්‍රීඩා උළෙල | 7,294,500.00 |
| 2. | ජාත්‍යන්තර තරඟ | 429,926.03 |
| | | |
| | **එකතුව** | **7,724,426.03** |

## පිළිගැනීම් සහ උපහාර

ජාතික හා ජාත්‍යන්තර තරග වලදි විශේෂ දක්ෂතා පෙන්වා රටට කිර්තියක් ලබා දී දැනට විශ්‍රාම සුවයෙන් සිටින හා දැනටත් ක්‍රීඩාවේ සක්‍රීනව සිටින ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් උපහාර පිදිම හා විශිෂ්ඨ ජයග්‍රහණ ලබා මවු බිමට පැමිනෙන අවස්ථා වලදී ගෞරවාන්විත පිළිගැනිම ක් ලබා දීම සඳහාත් පියවර රැසක් ගැනීමට 2016 වර්ෂය තුලදි ක්‍රියා කරන ලදි. ඒ සඳහා ලබා දුන් මුදල් හා දරන ලද වියදම් පහත දක්වා ඇත.

| අනුක්‍රමික අංකය | කාරණය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| 1 | ක්‍රීඩකයින් සඳහා උපහාර | 95,785,850.01 |
| | **එකතුව** | **95,785,850.01** |

## වෙනත් වියදම්

2016 වර්ෂය තුල ජාතික ක්‍රීඩා අරමුදලින් ගරු ක්‍රීඩා අමාත්‍යතුමාගේ අනුමැතිය මත දරන ලද අනෙකුත් වියදම් විස්තර පහත දැක්වේ.

| අනුක්‍රමික අංකය | කාරණය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| 1 | විවිධ වියදම් | 6,249,365.18 |
| 2 | පරිපාලන වියදම් | 360,000.00 |
| 3 | ජනාධිපති සම්මාන | 700,000.00 |
| 4 | වෙනත් දීමනා | 600,000.00 |
| | **එකතුව** | **7,909,365.18** |

## <u>2016 වර්ෂය තුල ශ්‍රී ලාංකීය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා</u>

ශ්‍රී ලාංකීය ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාත්‍යන්තර තරඟ වලදී ලබාගත් පදක්කම් පිළිබඳ සටහනක් පහත දක්වමි. මෙම දක්ෂතා ප්‍රදර්ශනය කිරිම සඳහා ජාතික ක්‍රීඩා අරමුදලෙන් විශේෂිත දායකත්වයක් ලබා දීමට හැකි විය.

| | ක්‍රීඩාව | තරඟාවලිය | පැවැත්වූ රට | රන් | රිදී | ලෝකඩ | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 1 | මලල ක්‍රීඩා | 12 වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙල | ඉන්දියාව | 9 | 11 | 17 | **61** |
| | | 7 වැනි ආසියානු ගෘහස්ථ මලල ක්‍රීඩා තරඟාවලිය | කටාර් | 0 | 1 | 1 | |
| | | The Great Relay | තායිලන්තය | 1 | 0 | 0 | |
| | | XXVI Kasyanov Memorial Meet | කසකස්ථානය | 0 | 1 | 0 | |
| | | තායිලන්ත විවෘත මලල ක්‍රීඩා ශූරතාවලිය | තායිලන්තය | 5 | 1 | 3 | |
| | | 6වන ආසියානු ජාත්‍යන්තර ළමා ක්‍රීඩා උළෙල | රුසියාව | 2 | 0 | 0 | |
| | | ඉන්දියන් ග්‍රෑන්ඩ් ප්‍රික්ස් | ඉන්දියාව | 0 | 1 | 1 | |
| | | වියට්නාම් විවෘත මලල ක්‍රීඩා ශූරතාව | වියට්නාමය | 2 | 1 | 1 | |
| | | Mokpo International Throwing Meet | ද. කොරියාව | 1 | 1 | 0 | |
| | | ආසියානු ශාන්තිකර කලාපීය ආබාධිත වූවන්ගේ මලල ක්‍රීඩා තරඟාවලිය | ඩුබායි | 1 | 0 | 0 | |
| 2 | ජිම්නාස්ටික් | පොදු රාජ්‍ය මණ්ඩලීය තරඟාවලිය | නැමිබියාව | 0 | 0 | 1 | **1** |
| 3 | මේස පන්දු | 12 වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙල | ඉන්දියාව | 0 | 1 | 10 | 24 |
| | | දකුණු ආසියා | පකිස්ථානය | 9 | 3 | 1 | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 07 | බැඩ්මින්ටන් | 12 වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙල | ඉන්දියාව | 0 | 2 | 6 | 8 |
| 08 | පැසිපන්දු | දකුණු ආසියානු බාස්කට්බෝල් ශූරතාවලිය - SABAU 18 | නේපාලය | 9 | 3 | 1 | 14 |
| | | | බංගලාදේශය | 0 | 0 | 1 | |
| 09 | කරාතේ දෝ | දකුණු ආසියානු කරාතේ දෝ ශූරතාවලිය | ඉන්දියාව | 9 | 14 | 28 | 60 |
| | | විවෘත කරාතේ දෝ ශූරතාවලිය | චීනය | 6 | 1 | 2 | |
| 10 | බොක්සින් | 12 වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙල | ඉන්දියාව | 0 | 5 | 4 | 9 |
| 11 | පා පැදි | 12 වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙල | ඉන්දියාව | 2 | 2 | 3 | 7 |
| 12 | හොකී | 12 වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙල | ඉන්දියාව | 0 | 1 | 0 | 1 |
| 13 | ජූඩෝ | 12 වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙල | ඉන්දියාව | 0 | 1 | 6 | 29 |
| | | Expo Judo Championship | තායිලන්තය | 4 | 6 | 4 | |
| | | North Bagkok University Championship | තායිලන්තය | 3 | 5 | 0 | |
| 14 | කබඩි | 12 වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙල | ඉන්දියාව | 0 | 0 | 2 | 7 |
| | | කණිෂ්ඨ ආසියානු කබඩි ශූරතාවලිය | ඉරානය | 0 | 0 | 2 | |
| | | ආසියානු කබඩි ශූරතාවලිය | කොරියාව | 0 | 0 | 1 | |
| | | 5 වන ආසියානු බීච් තරඟාවලිය | වියට්නාමය | 0 | 0 | 2 | |
| 15 | දැල් පන්දු | U 21 Asian Junior Championship | හොංකොං | 1 | 0 | 0 | 2 |
| | | ආසියානු ලෝක දැල්පන්දු ශූරතාවලිය | තායිලන්තය | 0 | 1 | 0 | |
| 16 | වෙඩි තැබීම | 12 වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙල | ඉන්දියාව | 0 | 4 | 8 | 12 |
| 17 | ස්කොෂ් | 12 වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙල | ඉන්දියාව | 0 | 0 | 3 | 3 |
| 18 | පිහිණුම් | 12 වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙල | ඉන්දියාව | 12 | 16 | 11 | 40 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 59 වැනි මැලේසියානු විවෘත පිහිණුම් ශූරතාව | මැලේසියාව | 0 | 1 | 0 | |
| 19 | ටයිකොන් ඩෝ | 12 වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙල | ඉන්දියාව | 0 | 1 | 4 | 25 |
| | | World Taekwondo Hanmadang | කොරියාව | 0 | 0 | 1 | |
| | | 10th Classic International Open Taekwondo | මැලේසියාව | 0 | 3 | 3 | |
| | | 1 වන බැන්කි මූන් ජාත්‍යන්තර ටයිකොන්ඩෝ ශූරතාවලිය | කොරියාව | 1 | 3 | 2 | |
| | | 6th Tirak International Friendship Taekwondo | මැලේසියාව | 0 | 2 | 3 | |
| | | 11th International Open Friendship Taekwondo | ඇමරිකාව | 1 | 1 | 0 | |
| 20 | ටෙනිස් | 12 වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙල | ඉන්දියාව | 0 | 0 | 6 | 6 |
| 21 | තුන් ප්‍රයාම | 12 වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙල | ඉන්දියාව | 0 | 0 | 2 | 2 |
| 22 | වොලිබෝල් | 12 වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙල | ඉන්දියාව | 0 | 2 | 0 | 2 |
| 23 | ක්‍රිකට් | ඔස්ට්‍රේලියා ශ්‍රී ලංකා ටෙස්ට් තරඟය | ඔස්ට්‍රේලියාව | ජයග්‍රහණය කර ඇත. | | | |
| | | සිම්බාබ්වේ ශ්‍රී ලංකා ටෙස්ට් තරඟය | සිම්බාබ්වේ | ජයග්‍රහණය කර ඇත. | | | |
| | | ආසියානු කුසලාන දෘශ්‍යාබාධිත පන්දුවාර විස්සයි විස්ස ක්‍රිකට් තරඟාවලිය | ඉන්දියාව | තෙවන ස්ථානය | | | |
| 24 | බර ඉසිලීම | 12 වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙල | ඉන්දියාව | 1 | 9 | 5 | 15 |
| | | පොදු රාජ්‍ය මණ්ඩලීය තරඟාවලිය | මැලේසියාව | 1 | 4 | 6 | 11 |
| | | | ඉන්දියාව | | | | |
| 25 | මල්ලොව පොර | 12 වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙල | ඉන්දියාව | 0 | 5 | 7 | 12 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 26 | වුෂු | 12 වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙල | ඉන්දියාව | 0 | 1 | 0 | 1 |
| 27 | හෙල්ල විසි කිරීම | පැරාඔලිම්පික් තරඟාවලිය | බ්‍රසීලය | 0 | 0 | 1 | 1 |
| 28 | කැරම් | ලෝක කැරම් ශූරතාවලිය | එංගලන්තය | 1 | 0 | 0 | 1 |
| එකතුව | | | | **85** | **122** | **164** | **371** |

# කෘතඥතාව

ජාතික ක්‍රීඩා අරමුදලේ කටයුතු කරගෙන යාමේදී ගරු ක්‍රීඩා ඇමතිතුමාගේ,ක්‍රීඩා අමාත්‍යාංශ නිලධාරින්ගේ හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ සහභාගිත්වය ඉතා අගය කොට සලකමි.

එච්.ටී.කමල් පත්මසිරි
ලේකම්
පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය

# ජාතික ක්‍රීඩා අරමුදල

## 2016-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් ගෙවීම් ගිණුම

| 2015 ලැබීම් රු. ශත | කොඩ් අංක 1 | කොඩ් අංක 2 | කොඩ් අංක 3 | ගිණුමේ නම සහ විස්තරය | ගිණුම් සටහන් | ලැබීම 2016 රු. ශත | ලැබීම 2016 රු. ශත |
|---|---|---|---|---|---|---|---|
| 7,314,386.24 | | | | ජනවාරි 01 දිනට ශේෂය | | | 6,114,474.86 |
| | 011 | 000 | 00 | ස්ථාවර තැන්පතු ආපසු ගැනීම | | 63,312,569.40 | |
| 1,718,916.96 | 020 | 000 | 00 | ස්ථාවර තැන්පතු පොළී | | 1,861,586.31 | |
| 27,000,000.00 | 041 | 000 | 00 | ආදායම් - ජාතික ලොතැරැයි මණ්ඩලය | | 49,000,000.00 | |
| 805,441.44 | 042 | 002 | 00 | විවිධ ලැබීම් - ශක්ති වරධන ශාලාවේ ලැබීම් | | | |
| 30,000,000.00 | 001 | 000 | 00 | ප්‍රදාන | | 10,000,000.00 | |
| - | 060 | 000 | 00 | විවිධ තැන්පත් | 08 | 75,000.00 | |
| 97,900.00 | 064 | 000 | 00 | වැය ශීර්ෂ වලට බැර | | | |
| 261,947.00 | 066 | 000 | 00 | ගෙවීම් ආපසු ලැබීම් | | 364,000.00 | |
| | | | | WHT ලැබීම් | | 52,330.14 | |
| 200,000.00 | | | | වෙනත් | | | |
| | | | | | | | 124,666,085.85 |
| 67,398,591.64 | | | | ලැබීම් එකතුව | | | 130,780,560.71 |
| **2015 ගෙවීම්** | | | | | | **2016 ගෙවීම්** | **2016 ගෙවීම්** |
| 15,000,000.00 | 011 | 000 | 00 | ආයෝජන ගිණුම | | | |
| 228,792.00 | 021 | 000 | 00 | ජාත්‍යන්තර තරග | | 429,926.03 | |
| 219,000.00 | 026 | 000 | 00 | පරිපාලන වියදම් | | 360,000.00 | |
| 1,080,814.00 | 027 | 002 | 00 | වෙනත් දීමනා | | 600,000.00 | |
| 39,913.97 | 027 | 003 | 00 | ශක්ති වර්ධන ශාලාවේ උපදේශක දීමනා | | | |
| 650,000.00 | 028 | 000 | 00 | ක්‍රීඩා භාණ්ඩ හා අනෙකුත් සැපයුම් | | 370,700.00 | |
| 1,952,230.81 | 030 | 000 | 00 | නිලධාරින්ගේ විදේශ සංචාර | | | |
| 3,657,000.00 | 033 | 000 | 00 | ක්‍රීඩකයින්ගේ පෝෂණ දීමනා | | 6,215,000.00 | |
| | 037 | 000 | 00 | ක්‍රීඩකයින් සඳහා වෛද්‍යාධාර | | 15,000.00 | |
| 18,543,750.00 | 038 | 000 | 00 | ක්‍රීඩකයින් සඳහා උපහාර | | 95,785,850.01 | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | 040 | 035 | 00 | ශ්‍රී ලංකා පාසල් රග්බි පාපන්දු සංගමය | | 750,000.00 | |
| | 040 | 035 | 00 | සමස්ථ ලංකා කරාතේ සංගමය | | 150,000.00 | |
| 76,000.00 | 040 | 035 | 00 | ශ්‍රී ලංකා පාසල් කරාතේ දෝ සංගමය | | | |
| | 040 | 035 | 00 | නුවරඑළිය දිස්ත්‍රික් මේස පන්දු සම්මේලනය | | | |
| 40,000,00 | | | | ශ්‍රී ලංකා බර ඉසිලීමේ සංගමය | | | |
| 40,000.00 | 040 | 035 | 00 | කැරම් සම්මේලනය | | | |
| 240,000.00 | 040 | 035 | 00 | ශ්‍රී ලංකා රුවල් ඔරු සංගමය | | | |
| 1,500,000.00 | 040 | 035 | 00 | ශ්‍රී ලංකා පාසල් නෙට්බෝල් සංගමය | | | |
| 470,800.00 | 040 | 035 | 00 | ශ්‍රී ලංකා පාසල් මළල ක්‍රීඩා සංගමය | | | |
| 296,000.00 | 040 | 035 | 00 | ශ්‍රී ලංකා බෝල්රූම්ඩාන්ස් සංගමය | | | |
| 150.000.00 | 040 | 035 | 00 | විගණන ගාස්තු ගෙවීම | | | |
| 167,166.00 | 043 | 000 | 00 | ජාතික මහ ක්‍රීඩා උළෙලට ගෙවීම් | | | |
| 5,088,500.00 | 046 | 005 | 00 | විවිධ වියදම් | | 7,294,500.00 | |
| 11,630,150.00 | 047 | 000 | 00 | දීමනා - වතු ආශ්‍රිත ක්‍රීඩා සදහා | | 6,249,365.18 | |
| 30,000.00 | 047 | 002 | 00 | ජාතික ක්‍රීඩා සභාව | | | |
| 184,000.00 | 052 | 000 | 00 | ජනාධිපති සම්මාන | | | |
| | 063 | 001 | 00 | එකතුව | | 700,000 | |
| 61,284,116.78 | | | | දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය | | | 118,920,341.22 |
| 6,114,474.86 | | | | ජනවාරි 01 දිනට ශේෂය | | | 11,860,219.49 |

## ජාතික ක්‍රීඩා අරමුදල
## 2016-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශේෂ පිරික්සුම

| කෝඩ් අංක 1 | කෝඩ් අංක 2 | කෝඩ් අංක 3 | ගිණුමේ නම සහ විස්තර | ගිණුම් | හර | බැර |
|---|---|---|---|---|---|---|
| | | | | සටහන් | රු.ශත | රු.ශත |
| 002 | 000 | 00 | සමුච්චිත අරමුදල 2016.01.01 දිනට | | | 226,480,957.14 |
| 011 | 000 | 00 | ආයෝජන ගිණුම 2016.12.31 දිනට | | 138,157,642.19 | |
| 013 | 000 | 00 | ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලි 2016.12.31 දිනට | 05 | 3,540,382.52 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 017 | 000 | 00 | ලැබිය යුතු ආදායම්- ජාතික ලොතැරැයි මණ්ඩලය | 06 | 12,503,590.00 | |
| 020 | 000 | 00 | ස්ථාවර තැන්පත් ආයෝජන පොලි | 04 | | 10,653,441.44 |
| 021 | 000 | 00 | ජාත්‍යන්තර තරඟ | | 429,926.03 | |
| 026 | 000 | 00 | පරිපාලන වියදම් | | 360,000.00 | |
| 027 | 002 | 00 | වෙනත් දීමනා | | 600,000.00 | |
| 033 | 000 | 00 | ක්‍රීඩකයින්ගේ පෝෂණ දීමනා | | 6,215,000.00 | |
| 037 | 000 | 00 | ක්‍රීඩකයින් සඳහා වෛද්‍යාධාර | | 15,000.00 | |
| 038 | 000 | 00 | ක්‍රීඩකයින් සඳහා උපහාර | | 95,815,850.01 | |
| 028 | 000 | 00 | ක්‍රීඩා භාණ්ඩ හා අනෙකුත් සැපයුම් | | 370,700.00 | |
| 040 | 035 | 00 | ශ්‍රී ලංකා පාසල් රග්බි පාපන්දු සංගමය | | 750,000.00 | |
| 040 | 035 | 00 | සමස්ථ ලංකා කරාතේ සංගමය | | 150,000.00 | |
| 041 | 000 | 00 | ආදායම් - ජාතික ලොතැරැයි මණ්ඩලය | 06 | | 37,404,670.00 |
| 043 | 000 | 00 | විගණන ගාස්තු ගෙවීම | | 360,000.00 | |
| 043 | 001 | 00 | විගණන ගාස්තු වෙන්කිරීම | | | 360,000.00 |
| 046 | 005 | 00 | ජාතික ක්‍රීඩා උළෙලට ගෙවීම් | | 7,294,500.00 | |
| 047 | 000 | 00 | විවිධ ගෙවීම් | | 6,249,365.18 | |
| 050 | 000 | 00 | මුදල් ශේෂය | | 11,860,219.49 | |
| 060 | 000 | 00 | විවිධ තැන්පතු | 08 | | 75,000.00 |
| 066 | 000 | 00 | ගෙවීම් ආපසු ලැබීම් | 01 | | 364,600.00 |
| 001 | 000 | 00 | ප්‍රදාන | | | 10,000,000.00 |
| 063 | 001 | 00 | ජනාධිපති සම්මාන | | 700,000.00 | |
| 038 | 000 | 00 | ක්‍රීඩකයින් සඳහා උපහාර-ගෙවිය යුතු | | | 30,000.00 |
| | | | වෙනත් ආදායම් | | | 3,506.84 |
| | | | | | 285,372,175.42 | 285,372,175.42 |

# ජාතික ක්‍රීඩා අරමුදල

## 2016-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ගිණුම

| ආදායම 2015 නැවත ප්‍රකාශිත රු.ශත | කොඩ් අංක 1 | කොඩ් අංක 2 | කොඩ් අංක 3 | ගිණුමේ නම සහ විස්තරය | ගිණුම් සටහන් | ආදායම් 2016 රු. ශත | ආදායම 2016 රු. ශත |
|---|---|---|---|---|---|---|---|
| | | | | ආදායම් | | | |
| 10,790,392.58 | 020 | 000 | 00 | ආයෝජන මත පොලී | 04 | 10,653,441.44 | |
| | 034 | 000 | 00 | අනුග්‍රාහක ලැබීම් | | | |
| 38,470,090.00 | 041 | 000 | 00 | ආදායම් - ජාතික ලොතැරැයි මණ්ඩලය | 06 | 37,404,670.00 | |
| 394,571.75 | 042 | 002 | 00 | ශක්ති වර්ධන ශාලාවේ ලැබීම් | | | |
| 200,000.00 | 042 | 003 | 00 | විවිධ ලැබීම් | | | |
| 261,947.00 | 066 | 000 | 00 | ගෙවීම් ආපසු ලැබීම් | 01 | 364,600.00 | |
| 30,000,000.00 | 001 | 000 | 00 | ප්‍රදාන | | 10,000,000.00 | |
| 4,943,281.22 | 060 | 000 | 00 | විවිධ තැන්පතු | | | |
| | | | | වෙනත් ආදායම් | | 3,506.84 | |
| 85,060,282.55 | | | | මුළු ආදායම | | | 58,426,218.28 |
| | | | | වියදම් | | | |
| | 023 | 023 | 00 | දේශීය තරග සඳහා මුදල් | | | |
| 219,000.00 | 026 | 000 | 00 | පරිපාලන වියදම් | | 360,000.00 | |
| | 027 | 003 | 00 | ශක්ති වර්ධන ශාලාවේ උපදේශක දීමනා | | | |
| 650,000.00 | 028 | 000 | 00 | ක්‍රීඩා භාණ්ඩ හා අනෙකුත් සැපයුම් | | 370,700.00 | |
| | 029 | 000 | 00 | වාර්තාකරුවන්ගේ විදේශ සංචාර | | | |
| 1,952,230.81 | 030 | 000 | 00 | නිලධාරීන්ගේ විදේශ සංචාර | | | |
| 3,657,000.00 | 033 | 000 | 00 | ක්‍රීඩකයින්ගේ පෝෂණ දීමනා | | 6,215,000.00 | |
| 76,000.00 | 040 | 035 | 00 | ශ්‍රී ලංකා පළාත් කරාතේ දෝ සංගමය | | | |
| 40,000.00 | 040 | 035 | 00 | නුවර එළිය දිස්ත්‍රික් මේස පන්දු සම්මේලනය | | | |
| 240,000.00 | 040 | 035 | 00 | කැරම් සම්මේලනය | | | |
| 1,500,000.00 | 040 | 035 | 00 | ශ්‍රී ලංකා රුවල් ඔරු සංගමය | | | |
| 470,800.00 | 040 | 035 | 00 | ශ්‍රී ලංකා පාසල් නෙට්බෝල් සංගමය | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 296,000.00 | 040 | 035 | 00 | ශ්‍රී ලංකා පාසල් මළල ක්‍රීඩා සංගමය | | | |
| 150,000.00 | 040 | 035 | 00 | ශ්‍රී ලංකා බෝල්රූම්ඩාන්ස් සංගමය | | | |
| | 040 | 035 | 00 | ශ්‍රී ලංකා පාසල් රග්බි පාපන්දු සංගමය | | 750,000.00 | |
| | 040 | 035 | 00 | සමස්ථ ලංකා කරාතේ සංගමය | | 150,000.00 | |
| | 037 | 000 | 00 | ක්‍රීඩකයින් සඳහා වෛද්‍යාධාර | | 15,000.00 | |
| 18,543,750.00 | 038 | 000 | 00 | ක්‍රීඩකයින් සඳහා උපහාර | | 95,815,850.01 | |
| | 040 | 001 | 00 | ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමය | | | |
| | 040 | 006 | 00 | ශ්‍රී ලංකා බාස්කට් බෝල සංගමය | | | |
| | 040 | 008 | 00 | ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමය | | | |
| | 040 | 035 | 00 | ක්‍රීඩා සමාජ | | | |
| 228,792.00 | 021 | 000 | 00 | ජාත්‍යන්තර තරග | | 429,926.03 | |
| | 040 | 042 | 00 | EW ක්‍රීඩා පදනම | | | |
| | 040 | 028 | 00 | මධ්‍යම පළාත් ප්‍රවීනයින්ගේ මළල ක්‍රීඩා සංගමය | | | |
| 167,166.00 | 043 | 000 | 00 | විගණන ගාස්තු ගෙවීම | | 360,000.00 | |
| 5,088,500.00 | 046 | 004 | 00 | ජාතික ක්‍රීඩා උළෙලට ගෙවීම් | | 7,294,500.00 | |
| 11,494,900.00 | 047 | 000 | 00 | විවිධ ගෙවීම් | | 6,249,365.18 | |
| | 047 | 002 | 00 | වතු ක්‍රීඩා කටයුතු දීමනා | | | |
| 1,007,040.00 | 027 | 002 | 00 | වෙනත් දීමනා | | 600,000.00 | |
| 165,100.00 | 052 | 000 | 00 | ජාතික ක්‍රීඩා සභාව | | | |
| | 040 | 032 | 00 | ශ්‍රී ලංකා දෘශ්‍යාභාදිත වුවන්ගේ ක්‍රිකට් සංගමය | | | |
| | 040 | 048 | 00 | ශ්‍රී ලංකාඇමේචර් බොක්ෂින් සංගමය | | | |
| | 063 | 001 | 00 | ජනාධිපති සම්මාන | | 700,000.00 | |
| 45,946,278.81 | | | | මුළු වියදම | | | 119,310,341.22 |
| 39,114,003.74 | | | | අතිරික්තය | | | (60,884,122.94) |

# ජාතික ක්‍රීඩා අරමුදල

## 2016.12.31 දිනට ශේෂ පත්‍රය

| කොඩ් අංක 1 | කොඩ් අංක 2 | කොඩ් අංක 3 | ගිණුමේ නම සහ විස්තරය | ගිණුම් සටහන් | 2015 නැවත ප්‍රකාශිත රු. ශත | 2016 රු. ශත |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | වත්කම් | | | |
| 050 | 000 | 00 | මුදල් ශේෂය | | 6,114,474.86 | 11,860,219.49 |
| | | | ලැබිය යුතු විශේෂ අත්තිකාරම් | | | |
| | | | විවිධ ණය ගැතියෝ | 03 | 26,935,620.20 | 16,043,972.52 |
| | | | | | 33,050,095.06 | 27,904,192.01 |
| | | | ජංගම නොවන වත්කම් | | | |
| | | | ආයෝජන ගිණුම | | | |
| | | | | | 193,430,862.08 | 138,157,642.19 |
| | | | මුළු වත්කම් | | | |
| | | | බැරකම් | | **226,480,957.14** | **166,061,834.20** |
| | | | ජංගම බැරකම් | | | |
| | | | විවිධ තැන්පත් | | | |
| 060 | 000 | 00 | උපචිත වියදම් | 08 | | 75,000.00 |
| 018 | 000 | 00 | වෙන්කිරීම් | 07 | | 390,000.00 |
| | | | ජංගම නොවන බැරකම් | | | |
| | | | | | | |
| | | | මුළු බැරකම් | | | 465,000.00 |
| | | | ශුද්ධ වත්කම් | | **226,480,957.14** | **165,596,834.20** |
| | | | | | | |
| | | | ශුද්ධ වත්කම් / ස්කන්ධය | | | |
| 002 | 000 | 00 | සමුච්චිත අරමුදල | 11 | 226,480,957.14 | 165,596,834.20 |
| | | | | | | |
| | | | මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය | | | |
| | | | වත්කම් | | **226,480,957.14** | **165,596,834.20** |

## ජාතික ක්‍රීඩා අරමුදල

## 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | මුදල | මුදල |
|---|---|---|
| | | රු. ශත |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන් | | |
| | (60,884,122.94) | (60,884,122.94) |
| වර්ෂයේ අතිරික්තය | | |
| | | |
| මුදල් නොවන වෙනස්වීම | | |
| ණය ගැතියෝ වැඩිවීම | 10,891,647.68 | |
| විවිධ තැන්පතු වැඩිවීම | 75,000.00 | |
| විවිධ ණය හිමියෝ අඩුවීම | 390,000.00 | 11,356,647.68 |
| | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන් | | (49,527,475.26) |
| | | |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය | | |
| | | |
| ස්ථාවර තැන්පත් අඩුවීම | 55,273,219.89 | |
| | | 55,273,219.89 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | |
| | | |
| මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම | | 5,745,744.63 |
| කාලච්ඡේදය ආරම්භයේ වූ මුදල් හා මුදල් සමාන දෑ | | 6,114,474.86 |
| කාලච්ඡේදය අවසානයේ වූ මුදල් හා මුදල් සමාන දෑ | | 11,860,219.49 |

## ජාතික ක්‍රීඩා අරමුදල

## 2016.12.31 න් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

| **2015** රු. ශත | ගිණුමේ නම සහ විස්තරය | **2016** රු. ශත |
|---:|---|---:|
| 187,366,953,40 | 2016.01.01 දිනට සමුච්චිත අරමුදල | 226,480,957.14 |
| 39,114,003.74 | 2016 වර්ෂයේ ඌණතාවය | (60,884,122.94) |
| 226,480,957.14 | 2016.12.31 දිනට සමුච්චිත අරමුදල | 165,596,834.20 |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதியின் திணைக்களம்
Auditor General's Department

සීඑෆ්/ඒ/එන්එස්එෆ්/එෆ්ඒ/2016 2018 ජනවාරි 05 දින

ලේකම්,

ක්‍රීඩා අමාත්‍යාංශය.

**ජාතික ක්‍රීඩා අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය සහ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 25(4) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාරිතාව.**

---

ජාතික ක්‍රීඩා අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදයම් සහ වියදම් ගිණුම, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශණය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශණය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 25(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණන කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ

### 1.3 විගණනයේ වගකීම

-------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810)අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තෙරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණනයේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳව ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ (3) හා (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමානවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

--------------------

### 2.1 මතය

---------------

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික ක්‍රීඩා අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූලික ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිලිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---------------------------------------------

**2.2.1 පැහැදිලි නොකළ වෙනස්කම්**

--------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කළ ශේෂ පත්‍රයේ දැක්වෙන ස්ථාවර තැන්පතු ශේෂය රු. 138,157,642ක් වූ අතර බැංකු සනාථ කිරීම අනුව ශේෂය රු. 138,161,920ක් වූයෙන් ශේෂ දෙක අතර රු. 4,278ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

------------------------------------------

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| | විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| i. | රාජ්‍ය සේවා ක්‍රීඩා උළෙල වෙනුවෙන් කුරුණෑගල සහ කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත දුන් මුදල් | 300,000 | වියදම් වාර්තා, බිල්පත් (i - iii) |
| ii. | පළාත් වැඩිහිටි උත්සවය සඳහා පඩුවස් නුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත දුන් මුදල් | 531,000 | |
| iii. | කොළඹ විශ්ව විද්‍යාලයේ වර්ණ ප්‍රදානෝත්සවය වෙනුවෙන් දුන් මුදල් | 500,000 | |
| iv. | ක්‍රීඩා වර්ණ ප්‍රදානය වෙනුවෙන් මාතර දිස්ත්‍රික් මළල ක්‍රීඩා සංගමයට දුන් මුදල | 200,000 | |
| v. | කරාතේ පෙර පුහුණු කඳවුර සඳහා සමස්ත ලංකා කරාතේ සංගමයට දුන් මුදල් | 150,000 | පුහුණුලාභින් පිළිබඳ විස්තර වියදම් වාර්තා,බිල්පත් |
| | | 1,681,000 | |

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම**

------------------------------------------------------------------------

1973 අංක 25 දරන ජාතික ක්‍රීඩා පනත යටතේ 25 (2) වගන්තිය ප්‍රකාර අමාත්‍යාංශයේ ලේකම් විසින් එක් එක් ලිත් වර්ෂය ඉකුත් වූ පසු හැකිතාක් ඉක්මනින් අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් පිළියෙල කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා එවැනි වාර්තාවක් පිළියෙල කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 60,884,123 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 39,114,004 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 99,998,127 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ක්‍රීඩකයින් සඳහා උපහාර උළෙලේ වියදම් රු. 77,272,100 කින් වැඩි වීම, ආයෝජන මත පොලී රු. 136,952කින් අඩුවීම, ජාතික ලොතරැයි මණ්ඩලයෙන් ලැබෙන ලැබීම් රු. 1,065,420කින් අඩු වීම සහ ප්‍රදානයන් රු. 20,000,000 කින් අඩු වීම ඉහත පිරිහීම් කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4 මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**4.1 කාර්ය සාධනය**

-----------------

ශ්‍රී ලංකාවේ ක්‍රීඩා වලට ධෛර්ය දීම, ඒවා දියුණු කිරීම හා සංවර්ධනය කිරීම අරමුදලේ ප්‍රධාන අරමුණ වූ අතර ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 22 වගන්තියෙන් ඒ සඳහා ක්‍රීඩා අරමුදලට නීතිමය ප්‍රතිපාදන සලසා තිබුණි. 2007 වර්ෂයේ සිට ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ ජාතික ක්‍රීඩා අරමුදල ක්‍රියාත්මක විය. 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 25 (1) වගන්තිය ප්‍රකාරව අරදමුදල පරිපාලනය සඳහා අමාත්‍යාංශ ලේකම් විසින් සමාලෝචිත වර්ෂයට අදාළව අරමුදලේ ක්‍රියාකාරකම් සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

----------------------------------------

**5.1 අභ්‍යන්තර විගණනය**

----------------------

ජාතික ක්‍රීඩා අරමුදල සඳහා සමාලෝචිත වර්ෂය තුලදී රු.මිලියන 58ක අදායමක් හා මුළු වියදම රු.මිලියන 119ක් වූ අතර අරමුදල සතුව සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති වත්කම්වල එකතුව රු. මිලියන 116ක් විය. ඒ අනුව මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක විය යුතු වී නමුත් අරමුදල සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. ක්‍රීඩා අමාත්‍යංශය යටතේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණ ද ජාතික ක්‍රීඩා අරමුදලේ කටයුතු එම අභ්‍යන්තර විගණන ඒකකය මඟින් විගණනයක් සිදුකිරීමට අවධානය යොමු කර නොතිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

--------------------------------

අයවැයගත සංඛ්‍යා හා තථ්‍ය සංඛ්‍යා සැසඳීමේදී විෂයයන් 11කට අදාළව සියයට 11 සිට සියයට 100 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 06. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අමාත්‍යංශයේ ලේකම්වරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) අයවැය පාලනය | අයවැය ගත ආදායම් හා වියදම් තත්‍ය ආදායම් හා වියදම් අතර විචලනයන් පැවතීම. |
| (ආ) අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණනයන් සිදු කර නොතිබීම. |

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

අතිරේක විගණකාධිපති

විගණකාධිපති වෙනුවට